# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2008 අංක 20 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

## 2008 අංක 20 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 මාර්තු මස 28 වන දින]

එල්.ඩී.— ඕ. 17/2006.

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 20 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6අ වගන්තියේ (1) වන උපවගන්තියේ "අවසන් කිරීමෙන් මාස තුනක් ඇතුළත" යන වචන වෙනුවට "අවසන් කිරීමෙන් මාස හයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1971 අංක 45 දරන පනතේ 6අ වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6ඇ වගන්තියේ "6වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 6අ වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "6වන වගන්තිය හෝ 6අ වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 6ඇ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "6 වන වගන්තිය හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "6 වන වගන්තිය හෝ 6අ වගන්තිය යටතේ කරනු ලබන නියමයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ පැති සටහනෙහි "6 වන වගන්තියේ විධිවිධාන" යන වචන හා ඉලක්කම් වෙනුවට "6 වන වගන්තිය හෝ 6අ වන වගන්තිය යටතේ කරනු ලබන නියමයකට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.